# 'අකාස කුසුම්' ඕස්ට්‍රේලියාවට..........

මේ දිනවල පැවැත්වෙන බ්‍රිස්බන් ජාත්‍යන්තර චිත්‍රපට උළෙලේ තිරගතවීමට නියමිත. ප්‍රසන්න විතානගේ අධ්‍යක්ෂණය කළ 'අකාස කුසුම්' චිත්‍රපටය සිංහල සිනමා ඉතිහාසයේ සුවිශේෂ සංධිස්ථානයක් සටහන් කළ සිනමා කෘතියකි. තවමත් ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශනය වී නොමැති අකාස කුසුම් චිත්‍රපටය පසුගිය ජූනි මස ස්පාඤ්ඤයේ (Spain) පැවති ග්‍රැනඩා ජාත්‍යන්තර චිත්‍රපට උළෙලේ දී (Cines Delsu Film Festival) ආසියාවේ හොඳම චිත්‍රපටයට හිමි NTPAC සම්මානය දිනා ගත්තේය. ඉරානයේ විශිෂ්ඨ සිනමා කරුවකු වන බෙනම් බෙසාඩි අධ්‍යක්ෂණය කළ 'අවමඟුලට පෙර' (Before Funereal) චිත්‍රපටය සමඟ ආකාස කුසුම් චිත්‍රපටය, 2009 වර්ෂයේ උසස්ම ආසියාතික චිත්‍රපටයට හිමි NETPAC සම්මානය බෙදා ගන්නා ලදි.

මෙම සම්මානය හැරනුවිට. 39 වන ඉන්දියානු ජාත්‍යන්තර චිත්‍රපට උළෙලේ (IFFI) රජත මයුර සම්මානය හිමි කර ගැනීමට 'ආකාස කුසුම්' ප්‍රධාන චරිතය රඟ පෑ මාලිනී ෆොන්සේකා සමත් විය. මෙම සම්මානය ශ්‍රී ලාංකික නිලියකට හිමි වූ විශිෂ්ඨතම ගෞරවය ලෙස සැලකේ. 2009 වර්ෂය මාලිනී ෆොන්සේකාගෙ 45 වසරක සිනමා ජීවිතය සපුරන අතර. ආකාස කුසුම් ඇයගේ 150 වන චිත්‍රපටයයි.

'අකාස කුසුම්' චිත්‍රපටයේ මෙල්බෝන් ප්‍රදර්ශනය සඳහා මාලිනී ෆොන්සේකා සහභා-ගි වීමට නියමිතය. මෙල්බෝන් දර්ශන අගෝස්තු 30 වන දින හා සැප්තැම්බර් 6 වන දින පැවැත්වීමට නියමිතයි.

> 'අකාස කුසුම්' චිත්‍රපටයේ මෙල්බෝන් ප්‍රදර්ශනය සඳහා මාලිනී ෆොන්සේකා සහභාග වීමට නියමිතය' මෙල්බෝන් දර්ශන අගෝස්තු 30 වන දින හා සැප්තැම්බර් 6 වන දින පැවැත්වීමට නියමිතයි'



අකාස කුසුම් චිත්‍රපටයේ මාලිනී ෆොන්සේකා සමඟ දිල්හානි ඒකනායක. නිම්මි හරස්ගම. කෞශල්‍යා ප්‍රනාන්දු. පුබුදු ප්‍රභාති. සුරාජ් මාපා හා සමන්මලී ෆොන්සේකා චරිත නිරූපනය කරති.

2009 වර්ෂයේ නොවැම්බර් මස පැවැත්වෙන ආසියා - පැසිපික් සම්මාන (APSA) උළෙල සඳහා නාම යෝජනා ලබා ඇති අකාස කුසුම්, ප්‍රංශයේ පැවති වීසෝල් ජාත්‍යන්තර චිත්‍රපට උළෙලේදී විශේෂ ජූරි ප්‍රනාමයද හිමි කර ගන්නා ලදී.

අකාස කුසුම් චිත්‍රපටය අගෝස්තු මාසයේ මුල සිට ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශනය ආරම්භ කරනු ඇත.

කේශව එදිරිසිංහ





---

31 වන පිටුවෙන් (තෙල් කුයිල)

මිතුරකු මානක් පසු කර යමින් හුන්නේය.

"ඒයි, භවානි කොහෙ යන ගමන්ද මේ උදේ පාන්දරින්ම ?"

භවානි නතර විය. මිටිකර බඳින ලද කුඩා පොට්ටනියක් ඔහුගේ උරහිසේ විය.

"මෙ ළඟට ගිහිල්ල එන්න කියල..."

" කොහෙහරි විශේෂ ගමනක් යනව වෙන්න ඕනෑ" මානක් කීය. " මොකද කියන්නෙ....දුමක් උරනවද?" ඔහු නැවතත් භවානි දෙස බලමින් විමසා සිටියේය.

මානක්ගේ අතින් මැටි පයිප්පය ගත් භවානි ඔහු අසලින් ඇන තියාගත්තේය.

"මම චම්බාවට යනව..සැණකෙළියට" අවසානයේ භවානි කීවේය.

භවානිගේ වදන් ඉඳිකටු තුඩක් සේ මානක් ගේ හදවත සිදුරු කළේය.

"සැණකෙළිය අද ද ?"

" හැම අවුරුද්දෙම වගේ...එකම දවසෙ තමයි" භවානි පිලිතුරු දුන්නේය. "ඇයි, අමතකද, මීට අවුරුදු හතකට කලියෙනුත් මේ වගේම දවසක සැණකෙළික උන්න". ඉන් එහාට කිසිත් නොකීමට භවානි වග බලා ගත්තේය.

භවානි ගේ සෝපහාස වදන් සියල්ල මානක් තුල කැළඹුම ක් ඇති කලේය. එකෙණෙහිම මැටි පයිප්පය පසෙකින් තැබූ භවානි පොට්ටනියද අතින් ගෙන නැගීසිටියේය. ඔහුගේ බටනළාව පොට්ටනියෙන් පහලට එල්ලෙමින් තිබිණි. භවානි ඈත නොපෙනී යන තුරුම මානක් ගෙ දෙනෙත රැඳී තිබුනේ ඒ වෙතය.

පසු දා උදෑසන කුඹුරෙහි වැඩ කරමින් හුන් මානක් සැණකෙලිය නිමවී ආපසු එන භවානි දැක ඕනෑකමින් ඔහුව මග හරින්නට මෙන් ඉවත බලාගත්තේය. භවානි සමග සැණකෙලිය පිලිබඳ වදනක් හෝ කතා කරන්නට මානක් ට අවශ්‍ය නොවිණි. එහෙත් අනෙක් පසින් පැමිණි භවානි මානක් ඉදිරියෙන් හිඳගත්තේය. ඔහුගේ මුහුණ සොවින් අළු පැහැ ගැන් වී තිබිණ.

"ගුලරී ජීවතුන් අතර නැහැ" භවානි බිඳුණු හඬින් කීවේය.

"මො ක ......ක්??"

" ඒකි ගිණි තියාගෙන...භූමිතෙල් වක්කරගෙ න.. උඹේ දෙවෙනි කසාදෙ ගැන අහල"

මානක් වේදනාවෙන් ගල් ගැසිණි. ඔහු ට කල හැකි වූයේ නිසලව නෙත් හයාගෙන තමා ගේ ජීවිතය දැවී පිළිස්සී යන අයුරු විඳගැනීම පමණකි.

කාලය වේගයෙන් ඉගිල ගියේය. මානක් නවතා දමා තිබුණු ගොවිතැන් කටයුතු නැවත ආරම්භ කළේය. කන්නට යමක් ලද විටෙක එය අනුභව කළේය. එහෙත් ඔහු ඇවිදින මළමිනියක් වැනි විය. මුහුණ හැඟුමින් තොර විය. දෙනෙත තුල හිස් බව විය.

"මම මෙයාගේ ගෑනි නෙමෙයි....හරියට පිට එකියක් වගේ". මානක් දෙවනුව කැඳවා ගෙන ආ බිරිඳ නොහොඳ නෝක්කාඩු කියන්නට වූවාය.

එහෙත් ඉක්මනින් ම ඕ ගැබ්බර වූවාය. තම අළුත් ලේලිය කෙරෙහි බොහොසෙයින් සතුටට පත්වූ මානක් ගේ මව වහ වහා මානක් වෙත දිව ගොස් පුවත සැල කර සිටියාය. එහෙත් කිසිත් නොවැටහුණු කලෙක මෙන් ඔහුගේ දෙනෙත හිස් බවින් මිරිකී තිබිණි.

දරුවා ලැබීමෙන් පසු, කාලයත් සමග සියල්ල වෙනස් වෙනු ඇතැයි කියමින් මානක් ගේ මව තම ලේලිය අස් වැසුවාය. එබැවින් සියල්ල විඳදරා ගන්නා ලෙස ඕ තම ලේලියගෙන් අයැද සිටියාය.

ඕ පුතකු බිහිකළාය. මානක් ගේ මව උතුරා යන ප්‍රීතියෙන් ප්‍රමුදිතව උන්නාය. බිළිඳා නහවා පිරිසිඳු කල මානක් ගේ මව බිළිඳා රෙදි කඩකින් ඔතා ඔහු ගේ උකුල මත තැබුවාය. ඔහු තම උකුල මත හිඳින දරුවා දෙස මොහොතක් නිසොල්මන්ව බලා හුන්නේය. කිසිත් අවබෝධනුවූවාක් මෙන් නොනවත්වාම බලා හුන්නේය. සුපුරුදු හිස් බවම හැරෙන්නට වෙනත් කිසිදු හැඟීමක් එහි සටහන්ව නොතිබිණි. සැණෙකින්, හිස් බවින් වැසී තිබුණු දෙනෙත් එකවරම භීතියෙන් විසල් විණි. මුව විවර විණි.

"මූව අහකට ගනිල්ලා...මූව අහකට ගනිල්ලා...මූ ළඟ භූමි තෙල් ගඳයි"

මානක් උමතුවෙන් මෙන් කෑගැවේය.

නිවාස සහ ඉඩකඩම් නවීකරණය කරගැනීමට
ඔබ සිතනවාද?
SETSQUARE PROPERTY
DEVELOPMENT
Architectural Designs For
Subdivisions
(Make use of your Large Backyard)
New Homes/Units
Development Plans
Extensions and Renovations
COVERS ALL SUBURBS
For Obligation Free Consultations
saamArt
Contact - Asanka Jayawardena
Mob : 0402 443 554 Tp : 9323 7393
asankapj@gmail.com